## පල්ලේපොල ප්‍රාදේශීය සභාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 02 දිනද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 සැප්තැම්බර් 06 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති පලලේපොල ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ). සභාව සතු ඉඩම් කට්ටි 07 ක ට අදාළ පර්චස් 260 ක වටිනාකම වූ රු.618,000 ක් ප්‍රාග්ධන ගතකර නොතිබුණි.

(ආ). ඉකුත් වර්ෂයේ කර්මාන්ත 63 කට අදාළ රු.14,202,037 ක ණයගැති ශේෂයක් සමාලෝචිත වර්ෂයේදී නිරවුල් වී තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තවදුරටත් ණයගැතියන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ). ඉකුත් වර්ෂයට අදාළව රු.10,070,331 ක ණයහිමි ශේෂයක් සමාලෝචිත වර්ෂයේදී පියවා තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තවදුරටත් ණය හිමියන් ලෙස මූල්‍ය ප්‍රකශනවල දක්වා තිබුණි.

(ඈ). ගිණුම් විෂයයන් 6 කට අදාළව පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.35,430,861ක් වූ අතර,

උපයෝගී ලේඛන/වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 42,244,642ක් වූයෙන් රු.6,813,781 ක වෙනසක් අනාවරණය විය.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.210,275 ක් වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,937,283 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 2,574,428 ක් විය.

2.2 මූල්‍ය පාලනය

1988 ප්‍රාදේශීය සභා ( මූල්‍ය හා පරිපාලන ) රීති මාලාවේ 99 රීතියේ විධිවිධාන වලට පටහැනිව රු.810,687 ක් වටිනා ගෙවීම් වවුචර් 17 ක් සහතික කිරීමකින් තොරව, ගෙවීම් කර තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්,තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තත්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තත්‍ය | දෙසැම්බර්31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 340 | 467 | 415 |
| (ii) බදු කුලි | 450 | 477 | 75 |
| (iii) බලපත්‍ර ගාස්තු | 690 | 526 | 50 |
| (iv) වෙනත් ආදායම් | 15,078 | 18,203 | 5,840 |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු මුදල්

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i). උසාවි දඩ | 1,492,450 |
| (ii). මුද්දර ගාස්තු | 3,158,097 |

2.3.3 වෙළඳ බලපත්‍ර ගාස්තු

පෙර වර්ෂවල සිට දිගින් දිගටම පැවත එන හිඟහිටි වෙළඳ බලපත්‍ර ගාස්තුව රු.49, 739 ක් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 (4) වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

2.3.4 වර්පනම් බදු හා අක්කර බදු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි වර්පනම් හා හිඟහිටි අක්කර බදු පිළිවෙලින් රු.337,137 ක් හා රු.91,890 ක් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) (අ) වගන්තියට අනුව කටයුතු කර නොතිබුණි.

2.3.5 කඩ කුලි

සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.75,930 ක්වූ හිඟහිටි කඩකුලී අයකර ගැනීම සඳහා1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තියයේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

2.3.6 ඉඩම් විකිණීමේ බදු

2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සභාව විසින් අයකරන ලද දඩ මුදල් හා අවස්ථා දෙකකදී ඉඩම් විකිණීම මත අයකරන ලද 1% බදු මුදල්වලට අදාළව රු.194,724 ක එකතු වටිනාකම් සභාවේ ආදායමට ගැනිමෙන් තොරව තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි

2.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

(අ). රු.960,400 ක් වටිනා වාහන හා යන්ත්‍රෝපකරණ විෂයයන් 06 ක් නිශ්ක්‍රියව හා ඌන උපයෝජිතව පැවතුණි.

(ආ). 2007 වර්ෂයේ සන්නිවේදන පියස ව්‍යාපෘතිය සඳහා මිළදී ගෙන තිබුණු රු.73,000 ක් වටිනා දුරකථන බිල්පත් යන්ත්‍ර 02 ක් හා රු.20,000 ක් වටිනා මුදල් සටහන් යන්ත්‍රයක් 2009 සැප්තැම්බර් 25 දින සිට විගණන දිනය වු 2012 ජුලි 09 වන දින දක්වා කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි.

2.5 අවිධිමත් ගණුදෙනු

(අ) අංක පචිෆ 437 හා 2008 සැප්තැම්බර් 18 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව, රාජ්‍ය අංශයට අයත් සියලුම වාහනවල රක්ෂණ ආවරණ සෘජුවම ජාතික රක්ෂණ භාර අරමුදලෙන් හෝ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙතින් ලබාගත යුතු වුවද, සභාව සතු අංක CPMO 5003 දරන යතුරු පැදිය වෙනත් රක්ෂණ සමාගමක් වෙතින් රක්ෂණය කරවා ගෙන තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය තුළ රාජකාර් කටයුතු සඳහා වාහන යොදවාගත් සභාවේ නිලධාරීන් පිළිබඳ විස්තර හා අදාළ රාජකාරී ස්වභාවය තහවුරු කර ගැනීමකින් තොරව, අවසථා 06 කදී රු.23,300 ක මුදලක් වාහන කුලී සඳහා සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගොපදේශ සංග්‍රහයේ 3.4 ,6.3 වගන්ති හා 1988 ප්‍රාදේශීය සභා ( මුල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 207, හා 208 රීති ප්‍රකාරව තරඟකාර් ලංසු ක්‍රමය හා ලියාපදිංචි තැපැල් මගින් මිල ගණන් කැඳවිය යුතු වුවත්, එසේ කිරීමකින් තොරව අතමිල ගණන් ලබාගෙන සමාලෝචිත වර්ෂයේ අවස්ථා 08 කදී රු.310,381 ක වටිනාකමට වූ ජලනල උපකරණ හා ලිපිද්‍රව්‍ය මිළදි ගෙන තිබුණි.

2.6 කොන්ත්‍රාත් පරිපාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ සඳහන් පොදු අරමුදලින් ක්‍රියාත්මක කිරීමට යෝජිත රු.325,000 කට ඇස්තමේන්තු කළ සංවර්ධන යෝජනා ක්‍රම 03 ක් වර්ෂය තුලදී ක්‍රියාත්මක කර නොතිබුණි.

2.7 හඳුනාගත් පාඩු හා හානි

සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව, සභාවට අයත් පුස්තකාල 02 ක වටිනාකම රු.4,037ක්ව පුස්තකාල පොත් 33 ක හා රු.64,000ක් වටිනා ඔටෝ ලෙවල් උපකරණයක ඌණතාවයක් අනාවරණය විය. මෙම ඌණතාවයන් සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකිරීමට හෝ සුදුස්සක් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

2.8 ප්‍රමාණවත් අධිකාර බලයකින් ආවරණය නොවූ ගනුදෙනු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1)(1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබා නොගෙන සේවකයින් 11 දෙනෙකු ආදේශක පදනම මත බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා වැටුප් වශයෙන් රු.1,507,695 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ). ගිණුම්කරණය
(ආ). ණයගැති හා ණයහිමි පාලනය
(ඇ). අභ්‍යන්තර පාලනය
(ඈ). අයවැය පාලනය
(ඉ). ආදායම් පරිපාලනය